සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

71 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................

# සිංහල I

කාලය පැය තුනයි

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) එ දවස් මිථ්‍යාදෘෂ්ටිකයන් ගෙනුත්, සම්‍යක්දෘෂ්ටිකයන් ගෙනුත්, බොහෝ දෙන රැස් වූය. මේ දෙපක්ෂයෙන් මිථ්‍යාදෘෂ්ටිකයෝ, 'මේ සුණොන් ආරාධනා කොට ශ්‍රමණ භවක් ගෞතමයන් ගෙට ම කළේ නම් හුදක් දන් දෙන්ට අමුතු නොවෙයි. ප්‍රශ්න විචාරා වෙහෙස දෙන්ට ය. ශ්‍රමණභවත් ගෞතමයන්ට වන සිලගු බලම්හ'යි. රැස් වූහ. සම්‍යක්දෘෂ්ටිකයෝ 'අද වූ කලී මේ සම්‍යක් සම්බුද්ධ නැමැති සූයඝීතෙමේ සැදැහැ නැති බමුණන්ගේ මිථ්‍යාදෘෂ්ටි නැමැති අඳුරු හරවනු නිසා දේශනා නැමැති ආලොකයත් ශරීරාලෝකයත් එක්කොට යහපත් පැයක් ගන්නට වයිති හනන්නා සේ අද අලොක දෙකක් විහිදුවයි.' අපිත් ගොසින් ඒ ආලොකයෙන් කෙලෙස්අඳුරු දුරුකරම්හයි සර්වඥවිලාස නැමැති රසාඤ්ජනය ඇස ගාම්හ'යි රැස් වූහ.

(i) මෙම ජේදයේ සඳහන් දෙපක්ෂය කවුරුන් ද?

(ii) එම කණ්ඩායම් දෙක රැස්වූයේ කුමන අරමුණුවලින් ද යන්න වෙන් වෙන්ව දක්වන්න.

(iii) මෙහි සඳහන් ආලෝක දෙක නම් කරන්න.

(iv) සිලගු, වයිති යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 4යි)

(ආ) ඒ කාලයට යට කියන ලද සඳකිඳුරු රජ්ජුරුවෝ තමන් කිඳුරංගනාව හා සමාන පර්‍වතයෙන් බැස ඒ ඒ ස්ථානයෙහි සඳුන් හර කඩා ගා විලවුන් ගන්නාහුය. තව ද මල් පට සඳහා වූ පොරෝනා වූ ලිය හෝ වැල්ලෙහි කෙළෙනාවූ මිහිරි ස්වරයෙන් ගී කියන්නාහු යට කියන ලද්දාවූ හොයට පැමිණ ඒ හොය ගොඩ තිබූ වැල්ලකට බැස දියවල මුල් කඩා දමා දිය කළ නැවත මල්පට හැඳ පෙරව රිදීපටක් බඳු වූ වැලික කලෙහි මල්හසුන් පනවා එක් වස්කුලලක් පිඹිමින් ගී කිය කියා කුසුමාසන මස්තකයෙහි උන් කල්හි කින්නරාංග හා මහරි මල්දම් බඳුවූ මොලොක් අත් නැමීමෙන් හෙළීමෙන් නුදුරුතන්හි සිට ගී කිය කියා විසිතුරු නැටීමක් නටන්ට පටන් ගත්හ.

(i) මෙම ජේදයේ සඳහන්වන රජ්ජුරුවන් කවුරුන් ද?

(ii) විලවුන් ලෙස යොදාගෙන ඇත්තේ මොනවාද?

(iii) ජේදයේ සඳහන් උපමාවක් සඳහන් කරන්න.

(iv) වල්පට, වස් කුලලක් යන්නෙහි අදහස් දක්වන්න (ලකුණු 4යි)

(ඉ) තවද මේ අනුරුද්ධ කුමාරයෝ ය. භද්දිය කුමාරයෝ ය. කිම්බිල කුමාරයෝ ය. යන මේ රජකුමරුවෝ තුන්දෙන පසළොස් සොළොස් හැවිරිදි අවස්ථාවෙහි ඔවුනොවුන් හා සමඟ කෙළ කෙළ හිඳ 'බත් උපදින්නේ කොයින්දැ' යි සැක කළහ. එයින් කිම්බල කුමාරයෝ එක් දවසෙක කෙළ ගෙණ යන්නාහු බඩසලින් වී බානා දැක ඒ සලකුණෙන් 'බත් උපදින්නේ බඩසලිනැ'යි කීහ. භද්දිය කුමාරයෝ දයවසෙක සැළියෙන් බත් රන් තලියේ ලන්නා දැක ඒ සලකුණෙන් 'බත් උපදින්නේ බඩසලින් නො වෙති. සැළියෙන්' යි කීහ. අනුරුද්ධ කුමාරයෝ කොටුවෙන් වී බානාත් නුදුටු විරූහ. සැළියෙන් බත් ගන්නත් නුදුටු විරූහ.

(i) මෙහි සඳහන් කුමාරවරුන් නම් කරන්න.

(ii) එම කුමාරවරුන්ට ඇති වූ ගැටලුව කුමක්ද?

(iii) ඔවුන් එම අවස්ථාවේ කුමක් කරමින් සිටියේ ද?

(iv) බඩසලින්, කෙළගෙන යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 4යි)

(ඊ) රජකුල අදර ල ත්
විදුමිණි රුවනකර යු ත්
පසිඳු මහ දනව ත්
ගඳෙව් කුලයක ඉපද බෝස ත්

කුමර කෙළි පුරු දුව
ගුරුන් පෙම්කොඳ තරි ඳුව
දිසි පින්පිඩු බ ඳුව
සොඳුරු ගුත්තිල නමින් පසි ඳුව

(i) මෙහි සඳහන් කර ඇති කුල දෙක නම් කරන්න.

(ii) බෝසතුන් ලෙස මෙහි දක්වා ඇත්තේ කවුරුන් ද?

(iii) ''ගුරුන් පෙම්කොඳ තරිඳුව'' යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

(iv) ගඳෙව්, පසිඳු යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 4යි)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) ''තොප මිය වෙන්වෙන තෙක් අපගේ ගෙන් වෙන් වූවා නැත. ''

(ii) '' අවලක්ෂණ තෝ මා නිසා නිරපරාධ වූ මාගේ සමනා මැරී ද?''

(iii) ''මෙතෙක් දා නුඹ මට ස්නේහ නැත්තේ ඇයි ද? ''

(iv) '' ඉස්සර වෙලා ම කියනවා එදා ඒ ගෑනි මාත් එක්ක කියපු කතන්දරේ''

(v) ''ගොස් දැන් සැතපෙන්නෙමි මම යහනේ ''

(vi) '' ඔය කියන්නේ බොරු උඹ මහ බොරුකාර ගෑණියෙක් '' (ලකුණු 8 යි)

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

මල්වල පාට අම්මේ කවුරු ද ගෑවේ
දලු අතු පැළී ඒවා කොහොමද ආවේ
මෙතරම් කැසුම ඇයි කහඹිලියා බූවේ
නිදිකුම්බා කොළේ මොකට ද නිදියෑවේ

පවතී අඬන හිරියා මල්වල සද්දේ
කෝදුරු රංචු අට්ටික්කා ගෙඩි මැද්දේ
කජු ඇට පුහුලමේ යටි පැත්තෙහි පැද්දේ
අම්මේ කළේ වේමා කවුරු ද බැද්දේ

ලස්සන රෝසමල් පඳුරට මොට ද කටු
කුමට ද බාඳුරා මල් කොකුවලට ගොටු
කජු ලුනු මිදෙලි ගස්වල මේ ඇලෙන හොටු
ගෑවේ කවුද මට කිව මැන කෙනෙකු දුටු

කොළයෙන් අක්කපාන මුල් අදිනු පෙනේ
කෝමාරිකා මද සීතල මොකද අනේ
තුත්තිරි කරල් හැබ ඇට මගෙ ඇඳුම් කොනේ
තැවරෙයි මෙවැනි ගති කොහොමද පුරුදු වුණේ

කවුරුද කුරුම්බා ඇතුළට දිය දෙන්නේ
ඇයි මේ වරා මල් සුළඟට ඉගිළෙන්නේ
මල් නැහැ දිවුල් ගස්වල මෙලෙසින් වන්නේ
කොහොම ද කියා අම්මා නොමැති ද දන්නේ

සමහර මල් තිබේ ලස්සන එමට ඇත
එනමුදු සුවඳ නම් ගෑවුණු තැනක නැත
සමහර මලක තනි සුදුමැලි පැහැය ගත
තිබුණත් සුවඳ පිනවයි දුටු අයගේ සිත

සුදු පාටක් තිබේ දලුවල මුස්සැන්න
නාදලු කුරුඳු දලු රන් පැහැ පවතින්න
මදු දලු බුලත් දලු කොළ පාටින් එන්න
හැදුවේ කවුද මට ඕනෑ දැනගන්න

කළුමැදිරිය කළුය, ඇට්ටේරිය සුදු වේ
කොස් ගන පනැගි රතු, එක කැලයක පොදු වේ
හටගත් ලී මෙසේ නෙක පැහැයට බෙදු වේ
අම්මේ! කවු ද පවසනු මැන පින් සිදු වේ

ලෙලි කටු පැඟිරි කෙඳි සහිතව හට ගන්නයි
පැණි රහ කහට රහ පල ඇති බව ඇත්තයි
සමහර ගෙඩි ඇඹුල්, සමහර ගෙඩි තිත්තියි
ඇයි මේ වෙනස අම්මා විමසිය යුත්තයි (ලකුණු 16යි)

02. අදින්න පුබ්බක බ්‍රාහ්මණයාගේ චිත්තභ්‍යන්තරයෙහි වූ දාරක ස්නේහය අභිබවමින් මසුරුබව ඉස්මතු වූ ආකාරය මට්ටකුණ්ඩලී කථාව ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

03. පතිව්‍රතා ධර්මය ආරක්‍ෂා කිරීමේ අගය මැනවින් නිරූපණයකර දැක්වීමට ජාතක කතාකරු සමත්ව ඇති ආකාරය චන්ද කින්නර ජාතකය ඇසුරෙන් පහදන්න.

නැතහොත්

ගිහි ජීවිතයේ කටුක බව සහ පැවැදි ජීවිතයේ සරල බව ඉතා රසවත්ව පූජාවලි කතුවරයා ඉදිරිපත්කර ඇති ආකාරය අනුරුද්ධ කුමාර කථාව ඇසුරෙන් දක්වන්න. (ලකුණු 15 යි)

04. බරණැස් රජුගේ තේජස හා කීර්තිය ගුත්තිල කාව්‍ය රචකයා වර්ණනාකර ඇති ආකාරය උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

05. බැද්දේගම අවට තිබූ වනය පිළිබඳ රචකයා කර ඇති වර්ණනය තුළින් පාඨක සිතෙහි බියජනක සිතුවිලි ඇති කරවයි. උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

06. ‘ළමා ගතිපැවතුම් හා ළමා සිතුවිලි තත්වාකාරයෙන් ඉදිරිපත් කිරීමට වෙසක් පහන කෙටි කතාව සමත් වී ඇත.’ විමසන්න. (ලකුණු 15යි)

07. කොළඹ යුගයේ කවීන් විවිධ තේමා වස්තු විෂය කරගනිමින් සිය නිර්මාණ ඉතා රසවත්ව ඉදිරිපත් කර ඇත. උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

08. ශෛලිගත නාට්‍යයක මූලික ලක්‍ෂණ පෙමතො ජායතී සොකො නාට්‍ය ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

71 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය ............................ සිංහල II කාලය පැය තුනයි

- I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ **2,3,** ප්‍රශ්න ද, ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- I ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසේ පිළිතුරුපත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

01 වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන **එයට හිමි අංකය වරහන තුළ දමන්න.**

1.1 **අල්පප්‍රාණාක්ෂර** පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ප, ග, ච, බ, ට (2) බ, ච, ඩ, ස, ත (3) ද, ඩ, ළු, ක, ජ
(4) ත, ද, ග, ඩ, බ (5) ඪ, ත, ක, ප, ද (.........)

1.2 **වැරදි අක්ෂර වින්‍යාසය සහිත පදයක් සහිත** පද පේළිය තෝරන්න.

(1) අශෝභන, ආනන්දය, ප්‍රසාරණය, අතීක්ෂණ, ආශ්‍රමය
(2) ආපදාව, ප්‍රමෝදය, ඉච්ඡාව, වර්ධනය, විපත්ථිය
(3) අනුශාසනය, අන්තේවාසිකයා, රණ්ඩුව, ප්‍රතිමූර්තිය, අදෘශ්‍යමාන
(4) කැළඹීම, අවතරණය, වත්සල, ප්‍රස්තාවනාව, වනස්පතිය
(5) සංවත්සරය, අන්ධකාර, ශ්‍රේණිය, ප්‍රවේශය, ශ්වේත (.........)

1.3 **අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.

(1) කපුටා, ගිරවා, කොහා, පරෙවියා
(2) ගෝනා, මුවා, එළුවා, බළලා,
(3) දාස්පෙතිය, ඉද්ද, සේපාලිකා, ඩේලියා
(4) මාතර, ගාල්ල, බෙන්තර, හොරණ
(5) අභයගිරිය, කතරගම, නාගදීපය, මුතියංගනය (.........)

1.4 **පහත වරණ අතුරින් නිරවද්‍ය ප්‍රකාශය** තෝරන්න.

(1) සියළු ම ස්වර අඝෝෂ ශබ්ද වෙයි.
(2) තාලුජ " ශ " කාරය සංස්කෘත භාෂාවෙන් මිශ්‍ර සිංහල අක්ෂර මාලාවට එක් වූ අක්ෂරයකි.
(3) උගුර හෙවත් කණ්ඨය ඇසුරෙන් ව්‍යඤ්ජන අක්ෂර පමණක් උපදී.
(4) නූතන සිංහල හෝඩියට අලුතින් එක් වූ සඤ්ඤක අක්ෂර හයකි.
(5) ස්වර දෙකක් වෙනුවට ස්වරයක් ආදේශ කිරීම ගාත්‍රාදේශය නම් වේ. (.........)

1.5 **රේඵය, රකාරාංශය, යංශය හා පාපිල්ල** සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) කාර්‍ය්‍ය, ප්‍රයාසය, සන්ධ්‍යාව, තරුව
(2) තර්කය, ග්‍රන්ථය, කාර්යාලය, කුල්ල
(3) නර්තනය, වාක්‍ය, විද්‍යාව, එළුවා
(4) ප්‍රකට, වර්ධනය, ව්‍යාකරණ, නුහුරු
(5) ස්වර්ගය, ගද්‍ය, ප්‍රමාණය, සුදුසු (.........)

1.6 එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය** තෝරන්න.

(1) අක්ෂර වින්‍යාසය, උණුසුම් ප්‍රදේශය, මහා විද්‍යාලය, අමා බොජුන්
(2) කල්‍යාණ මිත්‍රයා, කතු වැකිය, පළමු තෑග්ග, පසේ බුදු
(3) දක්ෂිණ දිවයින, උයන් බිම, කනිටු දුව, කලණ මිතුරා
(4) අබිසෙස් මඟුල, ක්ෂීර සාගරය, දිවි වැට, ස්වභාව දහම
(5) ශාක්‍ය සිංහ, මිතු දම, මධ්‍යම පිළිවෙත, අකු විනිස (.........)

1.7 **තත්සම වචන පමණක් යෙදී ඇති වරණය** තෝරන්න.

(1) සුන්දර, මන්දර, ගින්දර, කින්නර
(2) දේශිත, භාෂිත, බාධිත, සාදත
(3) ආලෝක, ආලාප, ආහාර, ආකාර
(4) සමාන, විමන, ප්‍රමාණ, ශ්‍රමණ
(5) පරිසර, සුකුමාර, තිරසර, පරිවාර (.........)

1.8 මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නොදෙන පදයක්** ඇතුළත් වරණය තෝරන්න.

(1) දුක - සතුට, ප්‍රීතිය, සුඛ, සන්තුෂ්ටිය
(2) හික්මුණ - අසංවර, නොදමුණ, අදාන්ත, සංයත
(3) නැග්ම - හායනය, හානිය, ක්ෂයවීම, හීනවීම
(4) එළිය - අනාලෝකය, අඳුර, කළුවර, තිමිර
(5) රළු - මෘදු, සෞම්‍ය, සුමුදු, සිනිඳු (.........)

1.9 මුලින් දැක්වෙන පදයට **සමානාර්ථ පදයක් ඇතුළත් නොවන** වරණය තෝරන්න.

(1) දිය - ලෝකය, වතුර, ජය, දුනුදිය
(2) කලාප - මිටිය, සමූහය, පොකුර, ගොනුව
(3) නද - නාදය, සෝෂාව, හඬ, අසතුට
(4) යතුරු - යන්ත්‍රය, ගමන, යතුර, යාම
(5) ඉසුරු - ඊශ්වර, නායක, ඓශ්වර්ය, සම්පත්තිය (.........)

1.10 **අව්‍ය, විශේෂණ, අන්‍යාර්ථ, විභක්ති යන සමාසවලට** අයත් පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.

(1) වල්මත්, දුන්වත්, සඳතරුමල්, දුදන
(2) අසංවර, නිල්මානෙල්, දැම්දුරු, සුන්තුරු
(3) කුකවි, සුද්ධෝදන, එරුණුහස්, විදුරවි
(4) අවමන්, සුදුහුණු තිනෙත්, මීපැණි
(5) දසබල, කහමල, පසැස්, කිරිබත් (.........)

1.11 **කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.

(1) නටන, ගයන, වයන, ලියන
(2) කරනු, බලනු, දකිනු, අසනු
(3) රැකිලි, කිකිළි, කෙරිලි, ඇහිලි
(4) කැවීම්, පෙවීම්, දිවීම්, ගැනීම්
(5) ගැනීම, වැදීම, යැදීම, සිටීම (.........)

1.12 පහත සඳහන් වැකියේ **තද කළු අකුරින්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය** පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

වේගයෙන් **ආ** රිය පෙළ දුටු දරුවෝ මාර්ගයෙන් ඉවතට **පනිමින් නවතින්න** යැයි **කෑගැසූහ.**

(1) මිශ්‍රක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා, අවසානක්‍රියා
(2) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා
(3) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අවසානක්‍රියා, විධික්‍රියා
(4) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා
(5) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, විධික්‍රියා, අවසානක්‍රියා (.........)

1.13 **අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක්** දැක්වෙන වරණය තෝරන්න.

(1) මිනිස්සු, වැද්දෙකු, බූරුවෙක්, ගොනෙක්
(2) යකෙක්, බල්ලෙක්, ගෙම්බෙක්, නරියෙකු
(3) අඟනක්, අපි, ගෝනා, සතෙකු
(4) නරියෙක්, මිනිසෙක්, හිවලෙකු, මිනිසෙකු
(5) මම, කවුඩෙකු, පෙදරේරුවෙකු. මාළුවෙකු (.........)

1.14 **උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත** වරණය තෝරන්න.

(1) සුසිනිඳු, පරගති, පබල, දුබල
(2) අවමන්, පරිමාන, නිකෙලෙස්, විදෙස්
(3) ප්‍රබල, අබල, උපදෙස්, අපවාද
(4) කුදිටු, අපමණ, ජවන, අවප්‍රමාණ
(5) අධිමාන, අවගුණ, පසිඳු, නිසොල්මන් (.........)

1.15 " අශෝක **අධිරජ** බොහෝ උත්සාහයෙන් **හා** කැපවීමෙන් **ස්වදේශීය** ජනයාට නිදහස් රාජ්‍ය සේවාවක් කළෙන් ජනාදරයට පත් උත්තමයෙකි " යන වැකියේ තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ වර්ගයන්ට ද?

(1) සමාස, නිපාත, තද්ධිත,
(2) සමාස, උපසර්ග, නිපාත,
(3) නිපාත, උපසර්ග, කෘදන්ත,
(4) සන්ධි, නිපාත, සන්ධි,
(5) නිපාත, නිපාත, සන්ධි, (.........)

1.16 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති වරණය තෝරන්න.

(1) විමල්, උගත්, පබඳ, අවගුණ
(2) යක්කු, සන්නස්, වත්තම්, බළල්ලු
(3) නාගරික, ග්‍රාමීය, නූතන, ප්‍රියතම
(4) බැස, කිමිද, ඇවිදින්, පිවිස
(5) මම, අපි, සිංහයෙක්, මුවන් (.........)

1.17 **සමාසයක් නොවන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.

(1) නූපන්, නාපන්, කුදිටු, සුබස්
(2) අවමන්, ගත්කරු, යව්දිව්, අනදර
(3) පරපුටු, දෙව්දත්, කිරිබත්, අත්කම්
(4) නොහොඳ, අසුර, නිසයුරු, රියහිමි
(5) අතවැසි, රජපිරිස්, බුදුගුණ, සොරබිය (.........)

1.18 **එකම වර්ගයට අයත් සන්ධිපද ඇතුළත්** වරණය තෝරන්න.

(1) සිතැති, වමත, බතල, රුවැති
(2) සිත්තම්, අත්තම්, සිත්තරු, වන්නම්
(3) තියුණු, හබරල, ශාලාධිපති, විවිධාර්ථ
(4) ගොවියෝ, කුරුල්ලා, සුදුස්සෝ, සැරියුත්
(5) සහෝදර, ගුණාගුණ, අරුණෝදය, සිතියම් (.........)

1.19 ව්‍යාකරණානුකූල ව **නිවැරදි වාක්‍ය** තෝරන්න.

(1) ගිරා රැන ඇතට පියාඹා යයි.
(2) විද්‍යාලයේ ශිෂ්‍යයන් ඇත.
(3) ඇතමෙකු බොරු කියති.
(4) පුතණුවෝ අවවාද පිළිගනිති.
(5) තාරකා රාත්‍රී අහසේ බබලති. (.........)

1.20 වඩාත් ම **නිවැරදි පද බෙදීම** සහිත වාක්‍ය තෝරන්න.

(1) කාන්තාවවෙත දරුවා ළඟා වෙයි.
(2) පියා හෝ අක්කා හෝ වැඩකළේ ය.
(3) මිනිස්සු ඉක්මන් ගමනින් නගර කරා යති.
(4) පොත්පොදිය බිම පතිත වෙයි.
(5) ගුරුතුමා ළමයා කැඳවාගෙන උදෑසනින්ම පාසල් යයි. (.........)

(ලකුණු 20 යි)

# සිංහල - II කොටස

02.**(අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

මිනිසා සන්නිවේදන සත්වයෙකි. අනෙක් සතුන් අතරින් මිනිසා වෙනස් වන්නේ ඔහු සතු උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය ආශ්‍රයෙන් සන්නිවේදනයේ යෙදෙන නිසා ය. ඔහු සතු භාෂා ශක්‍යතාවය අපූරු නිර්මාණ බිහි කරයි. පක්ෂීන් සිව්පාවුන් වැනි සත්වයින්ට ද සන්නිවේදන හැකියාව ඇතත් එය සීමා සහිත ය. කපුටෙකු කෑමක් දුටුවිට කෑ ගසා අනෙක් කපුටන් කැඳවන්නේ සන්නිවේදන ක්‍රියාවලිය තුළිනි. තමාගේ බල ප්‍රදේශයට පැමිණෙන බල්ලෙකු තවත් බල්ලෙකුට විලිස්සා කරන ගෙරවීම තුළ ඇත්තේ ද සන්නිවේදනයකි. එහෙත් මෙවැනි සන්නිවේදනයක් මනුෂ්‍යය භාෂාව හා සමතැන් ගන්නේ නැත. සත්ත්ව සන්නිවේදනයේ ඇත්තේ ඒ ඒ ස්ථානයකට සීමා වූ සන්නිවේදන ක්‍රමයකි. එහි කාලය හා අනාගතය පිළිබඳ පණිවිඩයක් නොලැබේ. එහෙත් ජන ශැතියට අනුව සත්ත්ව ක්‍රියාකාරකම් තුළින් පෙරනිමිති හඳුනාගැනීමක් පිළිබඳව අප සංස්කෘතිය සතුව තොරතුරු රැසක් පවතී. එහෙත් ඒවා නිශ්චිත වූ සන්නිවේදන මාර්ගයක් නොවේ. මිනිසා භාෂාව සමඟ කරන සන්නිවේදනය තුළ ඕනෑම ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. මානව භාෂාව වූ කලී කිසියම් සංස්කෘතියක මූලික පදනමයි.

1 මෙම ඡේදයේ මූලික අදහස කුමක් ද?

2 මෙහි ප්‍රධාන සන්නිවේදන ක්‍රම කීයක් තිබේ ද?

3 " එහි කාලය හා අනාගතය පිළිබඳ පණිවිඩයක් නෙලැෙබේ " යන්නෙහි අර්ථය දක්වන්න.

4 මෙහි කියවෙන පරිදි සංස්කෘතියෙහි පදනම කුමක් ද?

5 පහත පදවල අර්ථ පහදන්න.

ශක්‍යතාවය, උච්චාරණය, පදනම, ( ලකුණු 2 x 5 )

(ආ) පහත දැක්වෙන ඡේදය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් **එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියන්න. සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

මන්දපෝෂණයට ලක්වීමේ ඉහළම තර්ජනයට නතුවනුයේ කුඩා දරුවන් ය. ඔවුන්ගේ සහ වැඩිහිටියන්ගේ ශරීර ප්‍රමාණය අනුව බලන විට වැඩිහිටියන්ගේ ආමාශය වඩා විශාල වුවත් ඔවුන්ට වඩා කුඩා දරුවන්ට ආහාර අවශ්‍යය. නිතර ක්‍රියාකාරී කුඩා දරුවන්ගේ ශක්ති අවශ්‍යතා සහ ශරීර වර්ධනය සඳහා පෝෂණ අවශ්‍යතා ඉහළ මට්ටමක පවතී. මේ නිසා ශක්තිය, ප්‍රෝටීන්, කැල්සියම්, යකඩ ආදී පෝෂක බහුලව ලැබීම ඔවුන්ට ප්‍රයෝජනවත් ය.

නමුත් කුඩා දරුවන්ගේ ආමාශය කුඩා බව මතක තබාගත යුතු ය. මේ නිසා ඔවුන්ට වැඩිහිටියන්ට මෙන් තුන් වේලක් පමණක් ආහාර ගැනීම ප්‍රමාණවත් නොවේ. කුඩා බඩට කුඩා ආහාර වේල් ගණනාවක් ලැබීම අවශ්‍ය ය. එසේ වුවද කුඩා දරුවන්ට විවිධ රසකාරක වර්ග යොදා රස ගැන්වූ, විවිධ ඩයි වර්ග යොදා වර්ණ ගැන්වූ, නයිට්‍රේට් යොදා කල් තබා ගැනීමට සකස් කළ කෙටි ආහාර, රසකැවිලි හා මස් මාළු වැනි නිෂ්පාදන ලබාදීම අහිතකර ය.

කුඩා දරුවන් රෝගී වූ විට ඔවුන්ට ලබාදෙන ආහාර සීමා කිරීම ද වැරදි පිළිවෙතකි. රෝගී වූ විට කළ යුත්තේ ආහාර ලබා නොදීම නොවේ. දරුවා කැමති ලෙස සැකසූ ආහාර, විශේෂයෙන් ම වැඩි කැලරි (ශක්ති) ප්‍රමාණයක් සහිත ආහාර ලබාදීම අවශ්‍ය ය. යම්කිසි අසනීපයකින් පෙළුණු දරුවකු ඉන් සුවපත් වූවා යැයි පවසනුයේ එසේ රෝගී වීමට පෙර දරුවා සිටි බර යළි ලබාගත් පසුව ය. (ලකුණු 15)

03. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

i අධිවේගී මාර්ග රටෙහි සංවර්ධනයට හිතකර වේද?

ii වස විසෙන් තොර ආහාර රටාවකට යොමු වෙමු.

iii නිදහස් අධ්‍යාපනයට වැට බඳින උපකාරක පංති.

iv සෞඛ්‍ය සම්පන්න පරපුරක් සඳහා ක්‍රීඩාවේ අගය.

v මාධ්‍ය තුළ තිබිය යුතු සමාජ වගකීම.

vi ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති යෝජනාවලියක්. ( ලකුණු 25 )

04. (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

i අයියණ්ඩි රට වෙනුවෙන් දිවි දුනි.

ii පුතණුවෝ මෑණියන් රක්ෂා කරයි.

iii වෛද්‍යවරු හොඳ හිත ඇත්තෝ වෙති.

iv බල්ලා ද බෝලය ද පහළට වැටෙයි.

v කාන්තාවෝ රට පාලනයට සුදුසු නැත. ( ලකුණු 1 x 05 )

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

i මිනිසා ඇතුන් බලයි. ii මම උදෙන්ම බත් කමි.

iii තෝ කුමක් කරහි. iv මම පොත බැලුවෙමි.

v ඇමතිතුමා අප පසසයි. ( ලකුණු 1 x 05 )

(ඉ) **නිවැරදි වක්‍යයක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න

i (සමහරු/සමහරුන්) අඳුරේ අතපත ගාති.

ii බුද්ධිමත් පාඨක (ජනයා/ජනයෝ) යථාර්ථවාදී කතා රීතිය ප්‍රිය කරයි.

iii (සභාපතිවරයෙකු/සභාපතිවරයෙක්) සංස්ථාවට තවම පත්කර නැත.

iv මිනිසා ද නුඹ ද ගමට (හියෙහු/ගියෙහි ).

v පියා නෙහොත් පුතා කුඹුර (කොටති/කොටයි). ( ලකුණු 1 x 05 )

05. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරින්** දක්වා ඇති පදවල **අර්ථය විග්‍රහ කර** ලියන්න.

1 හිම පතනය ආරම්භ වූ බැවින් ක්‍රීඩකයෝ **අපේක්ෂාභංගත්වයට** පත් වූහ.

2 යුද්ධය අවසානයේ දී සෙබළු එහි වූවන් **රැති ලෙස** යටත් කළහ.

3 **පුරාකෘත** නිර්මාණ හොඳින් සුරැකීම යෙහෙකි. (ලකුණු 1 x 3 )

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න

1 රාත්‍රී කාලයේ හැසිරෙන

2 නැකත් නොමැති කාලය

3 පවුලක බාලම තැනැත්තා (ලකුණු 1 x 3 )

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට සුදුසු ම පදය පහත වරහන තුළ දී ඇති පද අතුරින් තෝරා** ලියන්න.

1 අපි අපේ ................ දියුණු කර ගත යුත්තෙමු.

2 ගැටළු විසඳීමට ................බුද්ධිය ප්‍රයෝජනවත් වේ.

3 ................යනු සමාන හදවතක් ඇත්තා ලෙස හැඳින්වේ.

4 ................තොරතුරු කෙරෙහි වැඩි විස්වාසය තැබීම එතරම් සුදුසු නොවේ.

5 මෙම වීදියේ වසන්නන් ................අය බව ප්‍රදේශ වාසීහු පවසති.

6 සෑම විටම ................අය බුහුමනට පත් වෙති.

(ධනවත්, සහෘදයා, ගුණවත්, ව්‍යවහාරික, කුසලතා, කාල්පනික) (ලකුණු 1/2 x 06)

(ඊ) **තද කළු අකුරින්** දක්වා ඇති **බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන** වාක්‍යය බැගින් තනන්න.

1. සියළු **දන** බුද්ධිමත්හු නොවෙති.
2. තමන් කළ දේ බොහෝවිට මෙලොවම **පල** දේ
3. ඔහු පැමිණි **සඳ** සත්‍ය හෙළි විය.
4. දරුවන් **වදන** මවුවරු බොහෝ දුක් උසුලති.
5. මම හොඳින් **සතර** ඉගෙන ගනිමි.
6. අපි **කම්** සැපයට වහල් වූවන් නොවෙමු. (ලකුණු 1 x 06)

6 පහත දැක්වෙන වාක්‍යවල **තද කළු මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය** දක්වා ඇත. ඒවායෙහි අනුඅංග දක්වන්න.

1 දරුවාට **නගරයේදී දුදන** ගති ඇති **මිනිසුන්** හමු විය.
(**නගරයේදී** - විභක්ති, **දුදන** - සමාස, **මිනිසුන්** - නාම )

2 **මැතිතුමා ප්‍රියතම** ගීත ගායනා **අස අසා** සිටියි.
(**මැතිතුමා** - සන්ධි, **ප්‍රියතම** - ප්‍රත්‍යාර්ථ නාම **අස අසා** - ක්‍රියා )

3 **මම හෙට** ගමට **යමි.**
**(මම** - විභක්ති, **හෙට** - නිපාත, **යමි** - ක්‍රියා **)**

4. ළමයා අවට **බලමින් සිටි** දරුවන් **සමඟ** සිනාසෙයි.
(**බලමින්** - ක්‍රියා, **සිටි** - ක්‍රියා, **සමඟ** - නිපාත )

5. **සොරමුළ පලා යද්දී** වැටුණු **ආභරණ පොදිය** පොලීසිය භාරයට ගැණුනි.

(**සොරමුළ** - සමාස, **පලා යද්දී** - ක්‍රියා, **ආභරණ පොදිය** - නාම) (ලකුණු ( 1 x 3 ) x 5 - 15)

7 පහත යෙදුම්වලට **ගැළපෙන** ප්‍රස්ථාව පිරුළ ලියන්න.

(අ) 1 කළ නොහැකි කාර්යක්.
2 එක් කරදරයක් සිදුව තිබිය දී තවත් කරදරයකට පත්වීම.
3 මිතුරු වෙසින් සතුරුකම් කිරීම.
4 උදවු ගෙන පසුව අමතක කිරීම.
5 කිසිදු අයුරකින් නිදහසක් නැති වීම.
6 පමණ දැන කටයුතු කිරීම. (ලකුණු 1/2 X 6)

(ආ) පහත දී ඇති **එක් එක් යුගල පද සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

| | | |
|---|---|---|
| 1 උදව් - උපකාර | 2 සතුරු - මිතුරු | 3 දඩි -පඩි |
| 4 අස් - පස් | 5 කා - බී | 6 ඔප්පු - තිරප්පු |

(ලකුණු 1 x 3 )

(ඉ) පහත දී ඇති **ප්‍රාදේශිය වයවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන** පද ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| 1 බිල්ල | 2 සකලයො | 3 අම්බරුවා |
| 4 යතුර | 5 තැරිගහනවා | 6 පෙළවහ |

(ලකුණු 1/2 X 6 )

(ඊ) පහත දී ඇති **රූඩිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

| | | |
|---|---|---|
| 1 අත පානවා | 2 අලෙයට්ටු | 3 කෝපි කාලෙ |
| 4 ඇඹලයා | 5 ඔළුව අත ගානවා | 6 ගජ බින්න |

(ලකුණු 1 X 6 )

08. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එකල්හිදෙවියොපළමුවැසිවැස්වූහමහාජනයොකුටජටිලයහටවැරැද්තැන්පටන්ගෙනැඅපමහරජහටවැඩවි යැවිජයකොටැආදවස්මැවැසිවටයිසතුට්වුහුදෙවියොවැළිදුසමන්මල්වැසිවැස්වුහඑක්බිතිකුදුමසුවැසිවැස්වූහඑක්බි තිකහවුන්වැසිවැස්වූහඑක්බිතිරුවන්අබරණවැසිවැස්වූහමහාජනයොසත්බුමුපායැසත්වනමාලෙහිසිටියාහුබැසදිව අබරණපළඳනාහුකුටජටිලයොවෙරැකෙළපීතන්පටන්ගෙනැඅපමහරජහටවැඩවීයැරිපුවිජයකෙළෙනුවරවන්දවස් මැවැසිවටමසුවැසිවටකහවුන්වැසිවටරුවන්අබරවැසිවටයිසතුට්වැබණන්නාහුරජහුකළපව්අනුමෙවීයහැ.

1 ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න. (ලකුණු 7)
2 **මූර්ධජ** අකුරු සහිත **පද දෙකක්** ඡේදයෙන් උපුටා ලියන්න.
3 ඡේදයේ ඇති **එක්බිති** යන පදයේ පිල්ලම් නම් කරන්න.
4 **විජය කොටැ ආ දවස් මැ වැසි වට යි සතුට් වුහු** යන වාක්‍ය ඇකාර රහිතව වර්තමාන ව්‍යවහාරයෙන් නැවත ලියන්න
5 රකාරාංශය හා ගයනුකිත්ත සහිත ඔබ දන්නා පදයක් ලියා දක්වන්න.

( ලකුණු 2 X 4 )

# දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018 - සිංහල I

**පිළිතුරු පත්‍රය**

## I කොටස

01. (අ) (i) මිථ්‍යාදෘෂ්ටිකයන්, සම්‍යක්දෘෂ්ටිකයන්

(ii) මිථ්‍යාදෘෂ්ටිකයන් - බුදුන්ගෙන් ප්‍රශ්න අසා වෙහෙස කරවීමේ අරමුණෙන්
සම්‍යක් දෘෂ්ටිකයන් - කෙලෙස් අඳුර දුරුකර සර්වඥ විලාස නැමැති රසඳුන ඇස ගැමේ අරමුණෙනි.

(iii) දේශනා නැමැති ආලොකය , ශරීරාලොකය

(iv) සිලගු - වෙහෙස, පීඩාව   වයිති - සායම්   (ලකුණු 4යි)

(ආ) (i) සඳ කිඳුරු රජ්ජුරුවන්

(ii) සඳුන් හර

(iii) රිදී පටක් බඳු වූ වැලිතලාව , මහරි මල්දම් බඳු වූ මොලොක් අත්

(iv) බටනලාව, ගස්වල පට්ටා හා කොළ ආදියෙන් සකස්කර ගන්නා ලද වස්ත්‍ර   (ලකුණු 4යි)

(ඉ) (i) අනුරුද්ධ, භද්දිය, කිම්බිල

(ii) බත් උපදින්නේ (ලැබෙන්නේ ) කොහොන්ද?

(iii) ක්‍රීඩා කරමින් / සෙල්ලම්කරමින්

(iv) භාණ්ඩ ශාලාව, සෙල්ලම් කරමින්   (ලකුණු 4යි)

(ඊ) (i) රජකුලය, ගාන්ධර්ව කුලය

(ii) ගුත්තිල

(iii) ගුරුවරුන්ගේ ආදරය නැමැති කොඳමල් වලට සඳ බඳු වී

(iv) ගාන්ධර්ව, ප්‍රසිද්ධ   (ලකුණු 4යි)

(උ) (i) සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී කතාවස්තුවෙ අදින්න පුබ්බක බමුණා තම පුතා මිය යෑම නිසා සොහොනෙහි හඬමින් සිටි අවස්ථාවේ දේවතාවන් තමා මට්ටකුණ්ඩලී බවත් දිව්‍ය ලෝකයේ උපන් බවත් ප්‍රකාශ කළ අවස්ථාවේ බමුණා විසින් දේවතාවන්ට ප්‍රකාශ කරන ලද්දකි.

(ii) චන්ද කින්නර ජාතකයේ බරණැස් රජ්ජුරුවන් කිඳුරා මරා තමාගේ බිරිඳවන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ කිඳුරිය විසින් රජුන්ට ප්‍රකාශ කරන ලදී.

(iii) බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ අනුරුද්ධ කුමාර කථා වස්තුවේ අනුරුද්ධ කුමාරයා විසින් මෑණියන්ට දේවතාවන් විසින් මවා දුන් දිව්‍ය වූ සුවඳ කැවුම් අනුභව කිරීමෙන් පසුව මෑණියන් වෙත ගොස් කරන ලද ප්‍රකාශයකි.

(iv) ගුණදාස අමරසේකර විසින් රචිත දිසොන්චිනාහාමි කෙටි කතාවේ කුමාර ජයවර්ධන විසින් බන්දුසේනට රෝගියාගේ රෝග ඉතිහාසය පිළිබඳ තොරුතුරු කියවමින් සිටි අවස්ථාවේ දී

(v) එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත පෙමතෝ ජායතී සොකො නාට්‍යයේ උද්දාල ඇඳුරුතුමන් විසින් දප්පුල සිසුට උද්දාල ඇඳුරු ස්වර්ණතිලක දැකීමෙන් කලබල වී සිටි අවස්ථාවේදී

(ඌ) ලකුණු 16 යි.
කාව්‍ය රසාස්වාදයට යෝග්‍ය වන සංකේත, ව්‍යංගාර්ථ, වර්ණනා, ආකෘතිය හා වස්තු විෂය පිළිබඳ අදහස් දක්වා තිබීම අවශ්‍යවේ.

* ප්‍රශ්න අංක 02 සිට 08 දක්වා ප්‍රශ්න වලට සපයා ඇති පිළිතුරුවල අදාළත්වය සලකා ලකුණු ලබාදෙන්න.

# සිංහල II

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 4 | (2) | 2 | (3) | 5 | (4) | 2 | (5) | 1 |
| (6) | 2 | (7) | 3 | (8) | 2 | (9) | 3 | (10) | 4 |
| (11) | 3 | (12) | 5 | (13) | 4 | (14) | 4 | (15) | 1 |
| (16) | 5 | (17) | 1 | (18) | 2 | (19) | 4 | (20) | 3 |

02 (අ) 1. මානව සන්නිවේදනය පිළිබඳව හැඳින්වීම 2.දෙකකි
3. එම සන්නිවේදනයෙන් කාලය සහ අනාගතය පිළිබඳව අදහසක් අර්ථවත් නොවේ.
4. මානව භාෂාව
5. හැකියාව, ශබ්ද කිරීම, ආරම්භය,

(ආ) ශරීරය කුඩා වුවද ක්‍රියාශීලී ළාබාලයාගේ පෝෂණය, ශක්තිය, ශරීර වර්ධනය පිළිබඳ අවශ්‍යතාව වැඩි බැවින්, අදාල පෝෂක බහුලව ලබාදීම අත්‍යවශ්‍ය ය. ආමාශය කුඩා බැවින් ඔවුන්ට කෙටි ආහාර වේල් ගණනාවක් මිස, රසකාරක, වර්ණක, කල් තබා ගැනීමට නයිට්‍රේට් යොදා සැකසූ කෙටි ආහාර, කැවිලි, මස් ලබාදීම අහිතකර ය. ඔවුන් රෝගී වූ කල්හි දරුවාගේ කැමැත්තට අනුව සැකසූ ශක්තිජනක ආහාර ලබා දී ඔවුන්ගේ බර නොවෙනස්ව රැකීමට උනන්දු විය යුතු ය.

03 ප්‍රමාණවත් කරුණු ගොණු කිරීම, සංවිධානාත්මක බව හා පැහැදිලි බව, නිවැරදි අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ දෝෂ රහිත වීම, ව්‍යක්තව බස හැසිරීම, ඡේදවෙන් කිරීම හා සම බව, භාෂා ප්‍රයෝග භාවිතය යනාදිය පිළිබඳව සහ වචන සංඛ්‍යාව පිළිබඳව සලකා ලකුණු ප්‍රදානය කරන්න.

04 (අ) 1. අයියණ්ඩි රට වෙනුවෙන් දිවි දුන්හ. 2. පුතණුවෝ මෑණියන් රක්ෂා කරති.
3. නිවැරදි වාක්‍යකි. 4. බල්ලා ද බෝලය ද පහළට වැටෙති.
5. කාන්තාවන් රට පාළනයට සුදුසු නැත.

(ආ) 1. මිනිසා විසින් ඇත්තු බැලෙති/බැලෙත්/ බලනු ලබති/බලනු ලබත්.
2. මා විසින් උදෙන්ම බත් කනු ලබයි/ලැබෙයි/ ලැබේ/ කැවෙයි.
3. තා විසින් කුමක් කෙරෙයි/ කරනු ලබයි/ ලැබෙයි.
4. මා විසින් පොත බැලිණි/ බලන ලදී/ බලනු ලැබීය.
5. ඇමතිතුමා විසින් අපි පැසසෙමු/පසසනු ලැබෙමු/ලබමු.

(ඉ) 1. සමහරු 2. ජනයා 3 සභාපතිවරයෙකු 4 ගියෙහු 5 කොටයි

05 (අ) 1 බලාපොරොත්තු සුන් වීමට 2 කැමති පරිදි 3 අතීතයේ කරන ලද
(ආ) 1 නිශාචර 2 නොනගතය 3 බඩපිස්සා/බාලයා
(ඉ) කුසලතා, ව්‍යවහාරික, සහෘදයා, කාල්පනික, ධනවත්, ගුණවත්
(ඊ) 1 ( ජනතාව ) -දානය, පිළිස්සීම, කැපීම, ධනය
2 ( විපාක ) - ගෙඩිය, වහල, ස්ථානය, යන්න (යන ක්‍රියා පදය)
3 ( කාලය ) - උතුම්, සන්ධිය, සැකය, සිත, කාන්තාව, උතුම්
4 ( ප්‍රසව කරන) - වචනය, මුහුණ, මුඛය, පිවිසීම
5 ( සතර) - හතර, බුදුන් වහන්සේ
6 ( කම් ) - කර්මය, කර්ම විභක්තිය, කැමැත්ත, අනංගයා, වැඩ

06

1. විභක්ති - ආධාර විභක්ති, 2. සමාස - අව්‍ය සමාස, 3. නාම - අනුක්ත නාම
4. සන්ධි - පර ස්වර ලෝප 5. ප්‍රත්‍යාර්ථ නාම - තද්ධිත 6. ක්‍රියා - මිශ්‍ර ක්‍රියා
7. විභක්ති -ප්‍රථමා විභක්ති, 8. අව්‍ය -නිපාත,කාලාර්ථයේ නිපාත
9. ක්‍රියා - අවසාන ක්‍රියා 10 ක්‍රියා - මිශ්‍ර ක්‍රියා 11 ක්‍රියා - පූර්ව ක්‍රියා
12. අව්‍ය - නිපාත ( සහාර්ථයේ නිපාත) 13. විභක්ති - පථමා විභක්ති,
14 ක්‍රියා - අසම්භාව්‍ය ක්‍රියා( කාලාර්ථයේ) 15. ක්‍රියා - පූර්ව ක්‍රියා

07 (අ) 1 ඉබ්බාගෙන් පිහාටු ගැනීම/ ගලෙන් පට්ටා ගැනීම
2 ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇනීම
3 අගේ ඉදන් කන කෑම
4 ඉහළට නැග ඉනිමගට පයින් ගැසීම
5 සෙක්කුවේ බැඳපු ගොණාවගේ , කොටි වලිගය අල්ල ගත්තා වගේ, ඇම ගිල්ල මාළුවා වගේ,ගිරයට අසුවූ පුවක් ගෙඩිය වගේ
6 ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න ඕනලු (සුදුසු පිළිතුරු පිළිගන්න.)

(ආ) 1 සමානාර්ථ යුගල පද
2 විරුද්ධාර්ථ යුගල පද
3 අර්ථ රහිත පද දෙකක් යෙදීම
4 අනුකරණාත්මක/ අනුප්‍රාසාත්මක ශබ්දරටා සහිත යුගල පද
5 පූර්ව ක්‍රියා දෙකක් යෙදුණු යුගල පද
6 පළමු පදයේ අර්ථ සහිත දෙවන පදයේ අර්ථ රහිත දෙකක් යෙදුණු යුගල පද

(ඉ) 1 සැඟවූ වස්තුවක් ලබාගැනීම සඳහා කෙරෙන ජීවිත විනාශය
2 කුරුල්ලො
3 මී හරකා
4 කුල්ල
5 දෙපයින් ඇද දෙකට ඉරීම ( මිනිසෙකුගේ )
6 විවාහය

(ඊ) 1. උදව් ඉල්ලනවා 2. කරදරකාර 3. පැරණි කාලය අයත්
4. යම් දෙයකට ගිජුව සිටින්නා 5. බොරුවට ප්‍රශංසා කිරීම 6. විශාල බොරුවක්

08 1 එ කල්හි දෙවියො පළමු වැසි වැස්වූහ. මහාජනයො " කුටජටිලය හට වැරැද් තැන් පටන් ගෙනැ අප මහරජ හට වැඩ වී යැ. විජය කොටැ ආ දවස් මැ වැසි වට "යි සතුටි වුහු. දෙවියො වැළි දූ සමන්මල් වැසි වැස්වූහ. එක්බිති කුදු මසු වැසි වැස්වූහ. එක්බිති කහවුන් වැසි වැස්වූහ. එක්බිති රුවන් අබරණ වැසි වැස්වූහ. මහාජනයො සත්බුමුපායැ සත් වන මාලෙහි සිටියාහු, බැස, දිව අබරණ පළඳනාහු, කුට ජටිලයො වෙරැ කෙළ පී තන් පටන් ගෙනැ අප මහරජ හට වැඩ වීයැ. රිපුවිජය කෙළෙ, නුවර වන් දවස් මැ වැසි වට, මසු වැසි වට, කහවුන් වැසි වට, රුවන් අබරණ වැසි වට'යි සතුටි වැ බණන්නාහු, රජහු කළ පව් අනුමෙවීයහැ.

2 අබරණ, පළඳනාහු
3 හල් කිරීම, කෙටි ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල
4 ජයග්‍රහණය කොට ආ දවසේ ම වැසි වැස්සේ යි සතුටු වූහ.
5 සුදුසු වචනයක් පිළිගන්න ( රකාරාංශය හා ගයනුකිත්ත සහිත )